දෙපාර්තමේන්තු චක්‍රලේඛ 10/ 2013 (වාරි හා ඵලදායිතා ප්‍රවර්ධන)

70 000/ I & PE/ 01
වාරිමාර්ග හා ඵලදායිතා ප්‍රවර්ධන අංශය,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.
**2013.05. 05**

සියළුම නිළධාරීන් වෙත,

## සහභාගීත්ව වාරි කළමනාකරණ කටයුතු - වප් හවුල වැඩසටහන

වප් හවුල වැඩසටහන ( **MANIS** ) යටතේ වාරි කළමනාකරණ කටයුතු සිදු කරන මධ්‍යම/ මහා වාරිමාර්ග ව්‍යාපාර **270** ක් වෙනුවෙන් ව්‍යාපාර කළමනාකරුවන් **135** ක් අනුයුක්ත කොට ඇත. කළමනාකරණ කටයුතු පහසු වනු පිණිස කුඩා ව්‍යාපාර කිහිපයක් එකතු කර එක් ව්‍යාපාර කළමනාකරුවකු යටතේ කටයුතු යොදා ඇත. එසේ වුවද එක් ව්‍යාපාර කළමනාකරුවකු සඳහා ව්‍යාපාර කමිටු කිහිපයක් තිබිය හැක.

ඒ අනුව, වප් හවුල වැඩසටහන යටතේ ක්‍රියාත්මක සියළුම ව්‍යාපාර වල ව්‍යාපාර කළමනාකරණ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. මෙමගින් ආවරණය වන්නේ සාමාන්‍ය ව්‍යාපාර කමිටු රැස්වීම් පමණක් වන අතර විශේෂ ගොවි දැනුවත් කිරීම හෝ වෙනත් පුහුණු වැඩසටහන් සඳහා වියදම් දැරීමට වැඩසටහන් හා ඇස්තමේන්තු වෙන් වෙන් වශයෙන් අනුමත කර ගත යුතු වේ.

වප් හවුල වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපාර කළමනාකරණ කටයුතු වල නියුතු නිලධාරීන්ට පහත සඳහන් පහසුකම් හා දීමනා ලබා දීමට මෙයින් අනුමැතිය ලබා දෙමි.

1. ව්‍යාපාර කළමනාකරුවෙකු සඳහා අමතර වශයෙන් දින හතරක **(4)** සංයුක්ත දීමනා ගෙවීම
2. ව්‍යාපාර කමිටුවට අඛණ්ඩව සහභාගී වන හා එහි ක්‍රියාකාරකම් වලට දායකත්වය සපයන කෘෂි කර්මාන්තයට අදාළ අනෙකුත් දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශවල නිලධාරීන්ට එක් නිලධාරියෙකුට, එක් කමිටුවකට රු. **250/=** බැගින් උපරිමය නිලධාරීන් පස් **(5)** දෙනෙකු සඳහා අමතර දීමනාවක් ගෙවීම.
3. ව්‍යාපාර කමිටුව සඳහා සහභාගි වන ගොවි නියෝජිත මහතුන්ට හා නිලධාරීන්ට තේ පැන් සංග්‍රහ කටයුතු සඳහා පැමිණීමේ ලේඛණය අනුව එක් අයෙකුට රු. **60** බැගින් වන පරිදි එක් ව්‍යාපාර කමිටු රැස්වීමකට රු. **3000** ක උපරිමයකට යටත්ව වැය කිරීම.
4. ව්‍යාපාර කමිටුවක් වෙනුවෙන් ලිපි ද්‍රව්‍ය මිළදී ගැනීමට හෝ මුද්‍රණ කටයුතු වෙනුවෙන් රු. **1000** ක උපරිමයකට යටත්ව ලිපි ද්‍රව්‍ය හෝ මුද්‍රණ කටයුතු සඳහා වියදම් කිරීම.

ඉහත **2, 3** හා **4** සඳහා ගෙවීම් සිදු කිරීමට ව්‍යාපාර කමිටු රැස්වීමට පූර්ව අත්තිකාරම් මුදලක් ලබාගෙන වියදම් කිරීමට ව්‍යාපාර කළමනාකරුට බලය පවරමි. එසේම ඉහත **2, 3** හා **4** හි ගෙවීම් අදාළ ව්‍යාපාර කමිටු මාසයකට වරක් බැගින් වර්ෂයකට උපරිමය ව්‍යාපාර කමිටු රැස්වීම් හයක් සඳහා පමණි.

ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාව හා පැමිණීමේ ලේඛණය සඳහා අනු අංක සහිත වෙන්ම පොත් පවත්වාගෙන යාම අනිවාර්ය බව සළකන්න. එමෙන්ම ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාව දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වැනි අදාළ ආයතන වල දිස්ත්‍රික් ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ට හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ වාරිමාර්ග හා ඵලදායිතා ප්‍රවර්ධන අංශයේ අධ්‍යක්ෂ යන අය වෙත යොමු කළ යුතු වේ. රැස්වීම පැවැත්වීමෙන් සති දෙකක් ඇතුළත අදාළ වාර්තාව නිම කළ යුතු වේ. තවද, වාර්තාවේ සඳහන් ක්‍රියාත්මක කළ යුතු කරුණු සම්බන්ධයෙන් අදාළ අංශ වෙත යොමු කිරීම ව්‍යාපාර කළමනාකරුගේ වගකීම වේ.

ඉහත කටයුතු වෙනුවෙන් වැය වන පිරිවැය ගොවි සංවිධාන සංවර්ධන (**Farmer Organ**
**Development)** වැය විෂය යටතේ දැරීමට කටයුතු කළ යුතු අතර එම ප්‍රතිපාදන ප්‍රමාණවත්
අවස්ථාවක නඩත්තු හා මෙහෙයුම් හෝ පරිපාලන වියදම් යටතේ ආවරණය කර ගැනීමට
වාරිමාර්ග ඉංජිනේරුට බලය පවරමි. කෙසේ වෙතත් අවශ්‍ය වාර්ෂික ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා
වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ඇස්තමේන්තුවක් ප්‍රධාන කාර්යාලය වෙත වර්ෂය ආරම
යොමු කළ යුතු වේ.

සිංහල හා දමිළ භාෂා දෙකටම අයත් ප්‍රජාවන් නියෝජනය කරන ව්‍යාපාර කමිටු රැස්වීම වල
පරිවර්තන සහය ලබා දිය යුතු වේ.

රජයේ මාර්ගෝපදේශය පරිදි සතියේ බදාදා දින අදාළ ඒකක කාර්යාලයේ රැඳී සිටිමින් අවශ්‍ය
සේවාවන් ඉටු කිරීම ව්‍යාපාර කළමනාකරුගේ වගකීමක් වේ. සහභාගීත්ව කළමනාකරණය මගින්
ප්‍රජාවට වඩාත් සමීප හා උසස් සේවාවක් ඉටු කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම
ව්‍යාපාර කළමනාකරණ කමිටු වත්මන් අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි ශක්තිමත් කිරීම මෙමගින් අ
කරනු ලැබේ.

ඉංජි. භද්‍රා කමලදාස
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්-

1. ලේකම්, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය - ක. දැ. ගැ. ස.
2. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් - ක. දැ. ගැ. ස.
3. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් - කා. දැ. ගැ. ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කා. දැ. ගැ. ස.

# වාරිමාර්ග දෙපාර්තමේන්තුව
# நீர்ப்பாசனத் திணைக்களம்
# IRRIGATION DEPARTMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් / Director General of Irrigation / பணிப்பாளர் நாயகம் | 011-2584984 | ෆැක්ස් / Fax / பக்ஸ் | 011-2505890 | ලිපිනය / Address / முகவரி | 230, තැ. පෙ. 1138, බෞද්ධාලෝක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව / 230, P. O. Box. 1138, Bauddhaloka Mw, Colombo 07, Sri Lanka / 230இ இ த.பெ. .1138இ பௌத்தாலோக்க மாவத்தைஇ கொழும்பு 07இ இலங்கை. |
| දුරකථනය (පොදු) / தொலைபேசி(பொது) / Telephone (General) | 011-2581162 | විද්‍යුත් ලිපිනය / ஈ.மெயில் முகவரி / E-mail Address | dgi@irrigation.gov.lk | වෙබ් අඩවිය / இணையதளம் / Web site | www.irrigation.gov.lk |
| මගේ අංකය / எனது இல / My No. | 70 000/I & PE/01 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2016/02/ |


දෙපාර්තමේන්තු චක්‍රලේඛ: **10/2013(I)** (වාරි හා ඵලදායිතා ප්‍රවර්ධන)

සියළුම නිලධාරීන් වෙත

**සහභාගීත්ව වාරි කලමනාකරණ කටයුතු - වප් හවුල වැඩසටහන**

වප් හවුල වැඩසටහන (MANIS) සඳහා නිකුත් කර ඇති 2013.05.05 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ 10/2013 (වාරි හා ඵලදායිතා ප්‍රවර්ධන) හි අංක 2. යටතේ සඳහන් කොන්දේසි පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

2. ව්‍යාපාර කමිටුවට අඛණ්ඩව සහභාගීවන හා එහි ක්‍රියාකාරකම් වලට දායකත්වය සපයන කෘෂි කර්මාන්තයට අදාල අනෙකුත් දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශවල නිලධාරීන්ට එක් නිලධාරියෙකුට, එක් කමිටුවකට රු.500/= බැගින් ව්‍යාපාර කමිටු දීමනාවක් ගෙවීම.

   මෙම දීමනාව ගෙවීමට අනුමත නිලධාරීන්:
   i. ප්‍රාදේශීය ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද මාණ්ඩලික නිලධාරියෙකු
   ii. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
   iii. කෘෂිකර්ම නිලධාරී හෝ කෘෂිකර්ම උපදේශක
   iv. පශු වෛද්‍ය නිලධාරී
   v. වාරිමාර්ග ආඥා පනතට අනුව පිළිගත් වෙනත් නිලධාරියෙකු

විශාල ප්‍රමාණයේ වාරි ව්‍යාපාර තුලදී, භූගෝලීය පිහිටීම මත එක් ආයතනයකින් නිලධාරීන් කිහිප දෙනෙකුගේ රාජකාරි බල ප්‍රදේශ ආවරණය වන විට ඉහත ලේඛන ගත තනතුරු දරණ නිලධාරීන් කිහිප දෙනෙකුට වුවද මෙම දීමනාව අදාල වේ.

තවද, කන්න රැස්වීම යනු සියළුම නිලධාරීන්ගේ අනිවාර්ය රාජකාරියක් වන බැවින් කන්න රැස්වීම් සඳහා මෙම දීමනාව අදාල නොවේ.

2013.05.05 දිනැති අංක.10/2013 (වාරි හා ඵලදායිතා ප්‍රවර්ධන) දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් කොන්දේසි එලෙසින්ම ක්‍රියාත්මකයි.

ඉංජි. වයි. අබ්දුල් මජීඩ
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

**ඉංජි. වයි. අබ්දුල් මජීඩ්**
**වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)**
**වාරිමාර්ග දෙපාර්තමේන්තුව**
**බෞද්ධාලෝක මාවත**
**කොළඹ 07.**

පිටපත්:

1. ලේකම්, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය : කාරු. දැ.ග.ස.
2. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් : කාරු. දැ.ග.ස.
3. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් : කාරු. දැ.ග.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක : කාරු. දැ.ග.ස.
5. සියළුම ව්‍යාපාර කලමනාකරුවන් : අ.ක.ස.